## කවි කොළය



# මගෙ රට ජයෙන් ජයටම ගෙන යනු මැනවී!

යුද බිය නිමා කොට ලේ සහ කඳුළු මුසු
බල මහිමයෙන් ජනතාවගෙ කතිරෙ ගැසූ
ජනපති තරඟ බිම පිම්මේ ඇදුණු අසූ
ජයගෙන සිටී අද මහ සටනකට පසු

කොටියා නැතත් කොටි කෙඳිරිලි තවම ඇසේ
පැහැදිලි ලෙසම අළු යට ගිනි පුපුරු දිසේ
විඳි දුක් ගැහැට අමතක කළ හැකිද කෙසේ
දැය රන් කිරුළ ගෙන තැබුවා ඔහුගෙ හිසේ


නිදහස ජාතියේ අවදානමක නොලා
මගෙ ලක්බිමට නව අරුණළු වැටුණි ගලා
බොරුවට වාටුවට ජනයා නොවුණි මුලා
යුද වීරයා ඔහු බව තීරණය කළා

සමහර විරිදු පස පුඟුලන් පතුරු ගසා
දොස් පවරද්දි දෙසමින් ගල් පැලෙන මුසා
පෙරලා පහර දෙන්නට ඔබ නොගිය නිසා
බැති මල් පොකුරු පිපුණා ලක් දෙරණ වසා

ඉඳ හිට කෙනෙකු දෙන්නෙකු සිටි ළග පාත
කෙරුවත් මෝඩ තකතිරුකම් අවි නීත
රට යටවුණේ නැත කරුමයකට ගෝත
ඔබමය පුතා ලක් මව වැදු අති ජාත

රුපු සෙන් හමුවෙ මුව පැතිරුණු සිනා වය
ගිය හැම තැනම ලද ජනතා ප්‍රණා මය
මේ වැනි ජයක් ඉතිහාසයෙ වුනා මය
ඔබ වැනි පුතෙකු රටකට වුවමනා මය

සමහර කරුණු පිළිබඳ සිදු නොවුණු ඉබේ
කිසියම් විවේචනයන් අපහටද තිබේ
එනමුදදු නොබැඳි නොසැලෙන පිළිවෙතට ඔබේ
නිසැකව තුනෙන් දෙක මැතිවරණයෙදි ලැබේ



නෙගෙටෙයි මෙයින් මතු
යුදපිටි වල රණවී
මහ බලවතුන් හමුවෙහි
වේවා නොනැවී
ජාතික සටන මෙහෙයන
රජිඳුනි සෙනෙවී
මගෙ රට ජයෙන් ජයටම
ගෙන යනු මැනවී!

♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



**ශ්‍රී** ලංකාවේ දෙමළ කොටි ත්‍රස්තවාදීන් විසින් සිංහල බෞද්ධයාගේ හදවත වන් දළදා මාළිගාවට **1998** ජනවාරි **25** වෙනි දින අළුයම දැවැන්ත බෝම්බ පුපුරවා හැරීමකින් සිදු කළ මහා විනාශයේදී එදින උදෑසන පූජාවට පැමිණ සිටි අතදරුවෙකු සමග සැදැහැවතුන් **8** දෙනෙකුද මියගිය අතර, **25** දෙනෙකුට අධික පිරිසකට බරපතල තුවාල සිදුවීය. දළදා මාළිගාවේ ඉදිරිපසද පොඩි පට්ටම් වීමෙන්ද, විෂ්ණු, නාථ හා පත්තිනි දේව ලද කැඩී බිඳී ගියේය. ඇතුළත පිළිම වහන්සේලාද ඒ මේ අත විසිරී බිඳී තිබුණද ආශ්වයර්යකට මෙන් අභ්‍යන්තර ගර්භයක තැන්පත්ර තිබුණු දළදා වහන්සේට කිසිදු හානියක් සිදු නොවී ය.

# ත්‍රස්තවාදයෙන් මියගිය අය වෙනුවෙන් සිහිවටන පින්කමක්!

**ව**සර 30 ක් පුරා පැවති කොටි ත්‍රස්තවාදය හමුවේ අප රටේ ජිවිතක්ෂයට පත් දහස් ගණන් ජනතාව අතර සංඝයා වහන්සේලා, සිල්මෑණිවරු, උපාසක උපාසිකාවන්, දරුවන්, ලේ කැටි බිළිඳුන්, ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ ග්‍රාමාරක්ෂකසේවයේ නියුක්ත වූවන් ආදී විවිධ තරාතිරම්වලට අයත් පිරිස වෙති. මේ නිහීන, අධම, කොටි ත්‍රස්තවාදී තිරිසනුන් නිසා අප රටට ජීවිතවලින්, දේපළ හා සංවර්ධන යෙන් වූ විනාශය ගිණිය නොහෙන තරමට අති මහත්ය. දළදා මාළිගාව හා ශ්‍රීමහා බෝධීන් වහන්සේ වැනි උතුම් පූජණීය ස්ථානයන් පවා ත්‍රස්ත ප්‍රහාරයට ලක්විය. වර්තමාන රාජ්‍ය නායකත්වයට හා අප දේශය වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන්, අප්‍රතිහත ධෛර්යයෙන් හා නොපසුබට උත්සාහයෙන් ක්‍රියා කළ රණවිරු දූ පුතුන්ට පින් සිදුවන්නට අද අපේ රට ඒ කුරිරු ත්‍රස්තවාදයෙන් විනිර්මුක්ත දේශයක්ව අනාගතයට මුහුණ දෙමින් සිටින්නීය.

ත්‍රස්තවාදය අවසන් කළ නමුදු ඒ ත්‍රස්තවාදයට බිළිවූ අය සිහිපත් කොට ඔවුන් උදෙසා පින් පැමිණවීමක් හා දේශප්‍රේමීන්ගේ ඒක රාශීවීමෙන් සමුළුවක් අපි කලක් තිස්සේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ පවත්වන්නෙමු. මෙවර ද ජනවාරි 24 වෙනි ඉරුදින එම කටයුත්ත සිදුකරන්නට අපට හැකිවිය.

එදින උදයේ අපේ ආරාධනය පිළිගෙන වැඩම කළ පූජ්‍ය විල්පිට ධම්මරතන ස්වාමීන් වහන්සේට දානය පිළිගන්වා ත්‍රස්තවාදයෙන් මියගිය අයට පිංපැමිණවීම සිදු කළෙමු.

එදින සවස තුනට වයඹදිග ලන්ඩනයේ ස්විස්කොටේජ් නම් පෙදෙසේ ප්‍රජා ශාලාවේ දේශප්‍රේමීන් රාශියක් සහභාගි වූ රැස්වීමක් පැවැත්විණ. ධම්මරතන හිමියෝ පැමිණ සිටි පිරිස තිසරණ පන්සිල්හි පිහිටවූහ. ඉන් ඉක්බිති රැස්වීම ආරම්භ වූයේ දේශප්‍රේමී වෛද්‍ය එම්. බී. රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙනි.

එදින අප සමුළුවට ආරාධනය කළ විශේෂ කථිකයා වූයේ ලංකාවිත්ති පුවත්පතේ කර්තෘ දයා ආනන්ද රණසිංහ මහතා ය. දොස්තර රණතුංග මහතා විසින් එම කතුවරයා හඳුන්වා දෙන ලද්දේ කිසිදු බලපෑමකට ගොදුරු නොවී, අභීතව පැන මෙහෙයවන, එසේම නොසැලී නොපැකිළ අදහස් ප්‍රකාශකරන අවංක දේශමාමක ලේඛකයෙකු වශයෙනි. රණසිංහ මහතාගේ කථාවේ මූලික අදහස වූයේ මෙවැනි සිහිකිරීම් පැවැත්වීමේ මූලික අදහස කුමක්ද? යන්න විදහා දැක්වීමය. ත්‍රස්තවාදය අවසන් වුවත් වසරක් පාසා මෙවැනි ව්‍යසන සිහිපත් කරන්නේ යළිත් එම ව්‍යසන සිදු නොවනු පිණිස එය සිහියේ තබාගෙන විමසිල්ලේ සුපරීක්ෂාකාරීව සිංහළ ජනතාව සිටිය යුතු බව මතක්කර දීමක් වශයෙන් යයි පැවසීය. එසේම සිංහළයාට ජාතියක් වශයෙන් පවතින්නට නම් තමා අවට සිදුවන දේ ගැන හොඳ සිහියෙන් යුතුව විමසුම් අසින් සම්මා ෂතියෙන් යුක්තව නිරන්තරයෙන් විසීම බවද ඒ මහතා වැඩිදුරටත් කීවේය.

වෛද්‍ය රණතුංග මහතා කොටි ත්‍රස්තවාදය ලංකාවෙන් අතුගා දමන්නට ලොව වටා ලාංකික දේශප්‍රේමීන් වසර 30 කට ආසන්න කාලයක් ගෙන ගියාවූ අරගලය විස්තර කළේය. එසේම සිංහළ වංශයේ පැවැත්ම හා අද දක්වා විකාශනයද සිංහළයින්ගේ හැකියා-වන් හා ලොවට ඔවුන් ගෙන ආ මූලික නිශ්පාදන ආදියද විග්‍රහකරමින් වසර දහස් ගණනකට ඉහත සිට අතීත සිංහළ ජන කොටස ලොව පැරණිම දියුණු ජාතීන් කීපයෙන් එක් ජාතියක්ව පැවති බව විස්තර කළේය. මේ දේශනයට සමානුරූපීව අනුර සෙනෙවිරත්න මහතා ග්‍රැපික් චිත්‍ර අනුසාරයෙන් විචිත්‍රවත් සිංහළ සංස්කෘතික රූප මාලාවක් තිරයේ විදහා දැක්වූයේ ය.

මෙම සිහිවටන පිංකම සාර්ථක කරගන්නට උදව් උපකාර කළ අප කමිටුවේ අජිත් ද සිල්වා සහ ජනක අලහප්පෙරුම මහත්වරු ඇතුළු පැමිණ සිට සියළු දෙනට ස්තුතිය පුදකරනු කැමැත්තෙමි.

♦ *කරුණා බස්නායක* **Hampstead London UK**




**ඉරිදා SUN** – මම ඡන්දෙ දාට පහුවදා ලංකාවට කතා කළා. විපක්ෂය කියනවා ජනාධිපති මහින්ද දිනුවෙ ලක්ෂ ගණන් හොර ඡන්ද දාපු හන්දයි කියලා. සෝමතුංග බාප්ප තවම විස්වාස කරන්නෙ එහෙමයි. බාප්ප තදට ජෙනරාල් තුමාට සපෝට් කළා. රැස්වීම් වලට ආපු සෙනග කන්දරාව ගැන හිතන කොට උන්නැහෙ පැරදුණු එක පුදුමලු. බාප්ප කියනවා හොර ඡන්ද පෙට්ටි ගොඩක් අහුවුනාලු ගෙදරක මඩුවක තිබිලා. ඒ පෙට්ටි වල ඡන්දෙත් දාලාම තිබුණලු. මං ඇහුවා බාප්ප දැක්කද ඒ පෙට්ටි කියලා නැහැයිලු කවුද කිව්වලු.

**සඳුදා MON** – ලංකාවෙ හුඟක් දෙනා තවම හිතන්නෙ පරණ සිංහළ චිත්‍රපටිවල විදියට. එක පරණ චිත්‍රපටියක මම දැක්කා පළාතෙ මන්ත්‍රීවෙන්න ඡන්දෙ ඉල්ලන හාදයෙක් වඩු බාස් කෙනෙක් හම්බ වෙන්න ඇවිත් කියනවා මට ඡන්ද පෙට්ටි දහයක් හදලදෙන්න, හැබැයි කාටවත් කියන්න එපා කියලා. ඒබාස් කවදාවත් එහෙම පෙට්ටියක් දැකලා නෑ. ඉතින් ඇහුවා හැබැට මහත්තෙ-යො ඔය ඡන්දෙ දාන පෙට්ටිය කොයි වගේද? කියලා. "මෙන්න මෙහෙමයි " කියලා හිස් සිගරට් පැකට් එකක ඇඳලා පෙන්නනවා. 'මතකඇතුව මැද හිලක් හදනවා ඡන්ද කොළේ දාන්න' කියලත් මන්ත්‍රී මැන් වඩු බාස්ට කියනවා. අන්න ඒ විදියට ඕන බාස් කෙනෙක් හදලා ගේන පකිස් පෙට්ටියක් ඡන්ද පෙට්ටියක් හැටියට ඡන්ද පොළට ගෙනාවම බාර ගන්නවයි කියලා ලංකාවෙ සමහරු තවමත් හිතන බව පේනවා.

**කුජදා TUE** – දැන් මොබයිල් පෝන් නිසා පණිවුඩ හුවමාරුව ලේසියි. ජෙනරාල් සරත් පොන්සේකා හමුදාවෙන් අත්අඩංගුවට ගෙනිච්චා කියලා ඒ සිද්ධ වෙච්ච වෙලාවෙම එස් එම් එස් පණිවුඩයක් අපේ මොබයිල් එකටත් ආවා. ඒක එවලා තිබුණෙ ජෙනරාල්ගෙ දුවගෙ නමින්. "අපේ තාත්තා නිරපරාදෙ අත්අඩංගුවට ගත්තා. වහාම විදේශ මාධ්‍ය වලට දන්වන්න්. විදේශයේ ආණ්ඩුවලට මානව හිමිකම් ආයතනවලට ඉක්මනට දන්වන්න" කියලා. මම ලංකාවට කතා කරලා බැලුවා. එතකොට කවුරුවත් ඒ ගැන දන්නෙ නෑ. පැය දෙක තුනකට පස්සෙ තමයි ප්‍රවෘත්තිවලට කියලා තියෙන්නෙ. මම අහන්නෙ මේකයි. කිසියම් වරදකට අපේ රටේ කෙනෙක්ව අත්අඩංගුවට ගත්තම ඒකට මානව හිමිකම් කාරයින්ට අඩගහන්නේ ඇයි? අපේ නීතියට අනුව කටයුතුකරන්න අපට බැරිද?

**බුදදා WED** - සිසිලුයි නන්දනියි ලංකාවට ගියා ඡන්දෙ කෙරෙන හැටි බලන්න කියලා. ආපහු ලන්ඩන් ඇවිත් ඊයෙ අපිට කතා කළා. නන්දනීලා එනකොට කැවුම් හැලප වගේ කැවිලියි තව කට්ටසම්බල් බෝතල් වගේකුයි ලංකාවෙන් අරන්ඇවිත්. මෙහේ හීත්රෝ එයාර්පෝට් එකේ දි ගෙනා සූට්කේස් ඇරලා හැලප පාර්සලේ දැකලා සුද්දා අහලා මේ මොනවද කියලා. නන්දනී කිව්වලු "දිස් ඊස් හැලප..." කියලා. සුද්දා කිව්වලු "වට් හෙල්ප්? අයි කාන්ට් හෙල්ප් යූ... දිස් ඊස් සීරියස් මැටර්..." කියලා. ආයිත් සුද්දා කිව්වලු මොනව හරි කෑම ගේනව නම් සීල් කරලා ගේන්න ඕන... කියලා. නන්දනී හැලපයක් දිග ඇරලා කැන්ද කොලේ පෙන්නලා කිව්වලු, මෙන්න මෙහෙමයි අපි සීල් කරන්නෙ. මීට වැඩිය මොන සීල් එකක්ද..? කියලා ඇහුවලු. වැඩේ හරි ගිහින් නැහැ. හැලප පාර්සලේ එතන තියලා ඇවිල්ලා. හරි අපරාදෙ!

**ගුරුදා THU** - මේ ළඟදි BBC ටෙලිවිෂන් ප්‍රෝග්‍රෑම් එකක පෙන්නුවා එංගලන්තෙ උසාවි, පොලීසිවල වැඩ කෙරෙන හැටි. ඒ තැන්වල අනිවාර්යයෙන්ම තිබිය යුතු දෙයක් තමයි ටිෂූ පෙට්ටියක්. ඒක විශේෂයෙන් ලංකාව ඇතුළු ආසියානු කාන්තාවො ගැන හිතලා කරපු දෙයක්. ඒ අය සාක්කි දෙන්න කූඩුවට නගිනකොට එතන නිලධාරියෙක් ටිෂූ පෙට්ටියක් අරගන කාන්තාව ළඟට දුවනවා. මොකද ආසියානු ගෑණු උදවිය සාක්කි දෙන්න පටන් ගන්නෙ වරුවක් විතර අඬලා. තව වෙලාවක් ගන්නවා කඳුළු, හොටු පිහිදාන්න. ඒ පාර ආයි අඬනවා. ටිෂූ පෙට්ටියෙ බාගයක් විතර ඉවර කරලා තමයි කතාකරන්න පටන් ගන්නෙ. මගදි ආයි අඬනවා. පොලීසියෙත් එහෙමයි. පැමිණිල්ල ලියාගන්න නිලධාරියා මේසෙට එන්නෙ ටිෂූ පෙට්ටියකුත් අරගෙන. නියම ටෙලි නාට්‍ය ජවනිකා තමයි. මෙහේ සුදු කාන්තාවො එක්ක එහෙම ප්‍රශ්නයක් මතු වෙන්නෙ නෑ. උන්ට ටිෂූ ඕන නෑ. උන් එකෙක් අඬන්නෙ නෑ අනුකම්පාව බලාපොරොත්තුව.

**කිවිදා FRI** - කැනඩාවෙ කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරාව එහේ පෙළපාලි ගියාලු ජෙනරාල් පොන්සේකා අත්-අඩංගුවට ගත්තට විරෝධය පාන්න. මෙන්න බොලේ දැන් කොටි පවා හිතනවා පොන්සේකා උන්ගෙ මිනිහෙක් කියලා. උන්ට දැන් ඕන ජෙනරාල්ව ජාත්‍යන්තර උසාවියකට ගෙන්නලා යුදඅපරාධ චෝදනාවලට ලංකා ලංකා රජය වැරදිකාරයො තමයි කියල ජෙනරාල් ලවා කියවගන්න. ඡන්දෙන් බැරිවෙලාවත් ජෙනරාල් බලේට ආවනම් අහන්න දෙයක් නෑ ආයිත් ඉතින් කොටින්ට නත්තල් තමයි. සමහර විට ලන්ඩන්වල කොටි ආයිත් පාර්ලිමේන්තුව ළඟ බඩගිනි උපවාසෙකුත් කරාවි.